# සමාජ සේවා දෙපාර්තමේන්තුව - බස්නාහිර පළාත
# சமூக சேவைகள் திணைக்களம் - மேல் மாகாணம
# Department of Social Services - Western Province

204, 3 වන මහල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල. 204, 3rd Floor, Densil Kobbekakuwa Mawatha, Battaramulla . 204, 3ஆம் மாடி, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My Ref. | SSD/03/01/චක්‍ර | ඔබේ අංකය<br>உமது இல<br>Your Ref. | | දිනය<br>திகதி<br>Date. | 2021.03.30 |

## බස්නාහිර පළාත් සමාජ සේවා චක්‍රලේඛ 2021/1

බස්නාහිර පළාතේ සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත.

**<u>ලාදුරු, පිළිකා, තැලසීමියා, ක්ෂය රෝගාධාර ලබාදීම</u>**

ලාදුරු, පිළිකා, තැලසීමියා, ක්ෂය රෝග වලින් පෙලෙන බස්නාහිර පළාතේ අඩු ආදායම්ලාභී රෝගීන්ට මාසිකව ආධාරයක් ලබාදීම සඳහා, බස්නාහිර පළාතේ ආණ්ඩුකාර ලේකම්ගේ අංක GOS/ADM/11/12(i) හා 2018.09.12 දිනැති ලිපියෙන් හා GOS/ADM/10 2021/02/19 ලිපියෙන් ලබා දී ඇති අනුමැතිය පරිදි, බස්නාහිර පළාත් සමාජ සේවා අධ්‍යක්ෂ විසින් "රෝගාධාර" ලබා දීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරනු ලැබේ.

බස්නාහිර පළාත් ආණ්ඩුකාර ලේකම්ගේ අංක GOS/ADM/10 2021/02/19 දිනැති ලිපිය අනුව 2021.02.19 දින සිට ක්ෂය රෝගාධාරය රු.3,000/- දක්වා සංශෝධනය කර ගෙවීම් කළ යුතුය. මේ සම්බන්ධයෙන් මීට පෙර නිකුත් කළ සියළුම චක්‍රලේඛ අවලංගු වන අතර, 2021.02.19 දින සිට මෙම චක්‍රලේඛය බල පැවැත්වේ.

2. රෝගාධාර ඉල්ලුම් කිරීම සඳහා සුදුසුකම්

   2.1 ඉල්ලුම්කරු පිළිකා, ක්ෂය, තැලසීමියා හෝ ලාදුරු රෝගයෙන් පෙලෙන්නෙකු විය යුතුය.

   2.2 රෝගාධාර ඉල්ලුම් කරන පුද්ගලයා බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.

   2.3 රෝගාධාර ඉල්ලුම්කරු රජයේ පිළිගත් ප්‍රතිපත්ති යටතේ අඩු ආදායම්ලාභී අයෙකු විය යුතුය.

3. වැඩිහිටි නිවාසයක හෝ පුනරුත්ථාපන ආයතනයක නේවාසිකව සිටින නඩත්තු ආධාර ලබන රෝගියෙකුට ද නඩත්තු ආධාර වලට අමතරව මෙම රෝගාධාර ලබාදිය හැකිය.

4. එකම පවුලේ මෙම රෝග වලින් පෙලෙන රෝගීන් කිහිප දෙනෙකු සිටින විට වෙන් වෙන් වශයෙන් ඔවුන්ට රෝගාධාර ලබාදිය හැකිය.


අධ්‍යක්ෂ புணிப்பாளர் 011-2092549 Director
සහකාර අධ්‍යක්ෂ உதவிப் பணிப்பளர் 011-2092551 Asst.Director
ගණකාධිකාරී கணக்காளர் 011-2092553 Accountant
පරිපාලන නිලධාරී நிர்வாக அதிகாரி 0112092554 Administrative officer
කාර්යාලය அலுவலகம 011-2093140 Office

වෙබ්/வலை/ WEB-www.ssd.wp.gov.lk ඊ-මේල්/E-mail /மின்னஞ்சல்– socialservdept@gmail.com ෆැක්ස්/ Fax /தொலைதகல்- 0112092560

5. රෝගාධාර ඉල්ලුම් කළ යුතු ආකාරය

රෝගාධාර ඉල්ලුම්කරු විසින් සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍රය ඇතුළු පහත සඳහන් ලේඛන තමා පදිංචි ග්‍රාම නිලධාරී වසම අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට භාර දිය යුතුය.

5.1. ග්‍රාම නිලධාරී විසින් සහතික කරන ලද WP/SSD/DI/01 ඉල්ලුම් පත්‍රය (ඇමුණුම - 1)
5.2. ඉල්ලුම්කරුගේ ජාතික හැඳුනුම්පතේ පිටපත හෝ පිළිගත හැකි හැඳුනුම්පතක පිටපතක්
5.3. ඉල්ලුම්කරු ප්‍රතිකාර ලබා ගන්නා රජයේ වෛද්‍ය නිලධාරී විසින් ආධාර ලබාදිය යුතු කාලය ද නිර්දේශ කරමින් නිකුත් කළ වෛද්‍ය සහතිකය.

i. සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ 1989.08.16 දිනැති 1604 දරණ චක්‍රලේඛය අනුව පිළිකා රෝගීන්ට නිකුත් කරන වෛද්‍ය සහතිකය - ඇමුණුම 02
ii. ක්ෂය රෝගීන්ට නිකුත් කරන වෛද්‍ය සහතිකය - ඇමුණුම 03
iii. සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ 1989.08.16 දිනැති 1067 දරණ චක්‍රලේඛය අනුව ලාදුරු රෝගීන්ට නිකුත් කරන වෛද්‍ය සහතිකය - ඇමුණුම 04
iv. තැලසීමියා රෝගීන්ට නිකුත් කරන වෛද්‍ය සහතිකය - ඇමුණුම 05

6. රෝගාධාර ගෙවීමේ ක්‍රමවේදය

6.1 පිළිකා රෝගීන්ට රෝගය සුව වනතුරු මසකට රු.1000/- බැගින් පිළිකාධාර ගෙවිය හැකිය.

6.2 ක්ෂය රෝගීන්ට මාස 3 ක් සඳහා මසකට රු. 3000/- බැගින් ක්ෂය රෝගාධාර ගෙවිය හැකිය. පළමු මාස 3 න් පසු වෛද්‍ය නිර්දේශය මත මාස 6 ක් දක්වා ආධාර ගෙවිය හැකිය.

6.3 ලාදුරු මර්දන ව්‍යාපාරයේ කාර්යභාර වෛද්‍යවරයා විසින්, සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ 1989.08.16 දිනැති චක්‍රලේඛ අංක 1607 හි සඳහන් පරිදි මාස 6 න් 6 ට ලාදුරු රෝගීන්ට නිකුත් කරන වෛද්‍ය සහතිකය අනුව මසකට රු.1000/- බැගින් ලාදුරු රෝගාධාර ගෙවිය හැකිය.

6.4 තැලසීමියා රෝගීන්ට රෝගය සුව වන තුරු මසකට රු 1,000 බැගින් තැලසීමියා රෝගාධාර ගෙවීමට හැකිය.

7. රෝගාධාර ඉල්ලීම් සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම හා අනුමැතිය ලබා ගැනීම

7.1 රෝගියාගේ ඉල්ලීම හෝ වෛද්‍ය සහතිකය ප්‍රාදේශීය ලේකම්ට ලැබීමෙන් පසු පළාත් සමාජ සේවා නිලධාරී එම රෝගී පුද්ගලයා හමුවී WP/SSD/DI/01 ආකෘතිය සම්පූර්ණ කළ යුතුය.(ඇමුණුම - 01)

7.2 එම වාර්තාව පළාත් සමාජ සේවා නිලධාරී සිය නිර්දේශය සමඟ ප්‍රාදේශීය ලේකම් වෙත ඉදිරිපත් කළ යුතුය.

7.3 ප්‍රාදේශීය ලේකම් විසින් නිර්දේශ කරන ලද රෝගාධාර ප්‍රතිලාභී ලේඛනය අනුමැතිය සඳහා හා ප්‍රතිපාදන ලබා ගැනීම සඳහා බස්නාහිර පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුවට යොමු කළ යුතුය.

7.4 බස්නාහිර පළාත් සමාජ සේවා අධ්‍යක්ෂ විසින් අනුමත කරන ලද රෝගාධාර ලේඛනය, රෝගාධාර ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සමග ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට එවීමෙන් පසු ප්‍රතිලාභියාට ගෙවීම් කළ යුතුය.

7.5 පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රතිපාදන ප්‍රමාණවත් වන්නේ නම්, රෝගාධාර ඉල්ලුම් කරනු ලබන මාසයේ සිට රෝගාධාර ගෙවීමට අනුමැතිය දෙනු ලැබේ.

7.6 පළාත් සමාජ සේවා අධ්‍යක්ෂගේ අනුමැතිය ලද පසු ක්ෂය, පිළිකා හා තැලසීමියා ආධාර අදාළ තැපැල් කාර්යාල මගින් ගෙවීමට කටයුතු කළ යුතුය. විශේෂ අවස්ථාවකදී පමණක් ප්‍රාදේශීය ලේකම්ගේ අභිමතය පරිදි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ද ගෙවීම් කළ හැකිය.

7.7 ලාදුරු ආධාරය මුදල් ඇනවුමක් මගින් රෝගීන්ට ගෙවිය යුතුය.

7.8 ආධාර මුදල් ගෙවීමට W.P/S.S/P.5 ආකෘතිය භාවිතා කළ යුතුය. (ඇමුණුම 06) ආධාර ගෙවීමේදී ඉදිරි මාසය සඳහා ආධාර ගෙවීම සිදු නොකළ යුතුය. පසුගිය මාසය සඳහා ඊළඟ මාසයේ පළමුවන දා සිට ආධාර ගෙවීම සිදුකළ යුතුය.

8. මාසිකව ගෙවනු ලබන රෝගාධාර වටිනාකම

8.1 මාසිකව ගෙවනු ලබන රෝගාධාර මුදල පහත පරිදිය.

| | | |
|---|---|---|
| ක්ෂය රෝගාධාරය | - | රු.3000/- |
| පිළිකාධාරය | - | රු.1000/- |
| තැලසීමියාධාරය | - | රු.1000/- |
| ලාදුරු රෝගාධාරය | - | රු.1000/- |

9. රෝගාධාර අත්හිටුවීම හෝ අවලංගු කිරීම

9.1 රෝගියා ප්‍රතිකාර ගැනීම නැවැත්වුවහොත් හෝ වෛද්‍ය සහතිකය ඉදිරිපත් නොකළහොත් හෝ රෝගාධාර ගෙවීම අත්හිටුවිය යුතුය. ප්‍රතිලාභී රෝගියා ක්ෂය රෝගියෙකු නම් හා තවදුරටත් රෝගී තත්වයෙන් පෙළෙන්නේනම් ඒ සම්බන්ධයෙන් පළාත් සමාජ සේවා නිලධාරී සොයා බලා, සෞඛ්‍ය බලධාරීන් සමග සම්බන්ධීකරණය වී, වෛද්‍යවරයා වෙත එම පුද්ගලයා යොමුකර ප්‍රතිකාර ලබාදීමට අවශ්‍ය පියවර ගත යුතුය.

9.2 ප්‍රතිලාභියාට රෝගය සුව වුවහොත් බස්නාහිර පළාත් සමාජ සේවා අධ්‍යක්ෂ වෙත දැනුම් දී රෝගාධාර ගෙවීම අවලංගු කළ යුතුය.

9.3 රෝගියා මිය ගියහොත් රෝගාධාර ගෙවීම බස්නාහිර පළාත් සමාජ සේවා අධ්‍යක්ෂගේ ආවරණ අනුමැතියට යටත්ව වහාම අවලංගු කර ඒ බව දැනුම් දිය යුතුය.

10. බස්නාහිර පළාත් සමාජ සේවා අධ්‍යක්ෂ විසින් රෝගාධාර ගෙවීම අනුමත කිරීම කරනු ලැබේ. යම් ගැටළුකාරී තත්වයක් හෝ විශේෂ අවස්ථාවක් පැන නැගුණු විට ප්‍රාදේශීය ලේකම්ගේ හෝ සමාජ සේවා සහකාර අධ්‍යක්ෂගේ නිරීක්ෂණ හා නිර්දේශ සැලකිල්ලට ගෙන පළාත් සමාජ සේවා අධ්‍යක්ෂ විසින් රෝගාධාර ලබාදීම සම්බන්ධයෙන් අවසාන තීරණය ගනු ලැබේ.

චන්දිමා දිසානායක
අධ්‍යක්ෂ
සමාජ සේවා දෙපාර්තමේන්තුව
බස්නාහිර පළාත

පිටපත් :-

1. ප්‍රධාන ලේකම්, බස්නාහිර පළාත.
2. ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාර ලේකම් කාර්යාලය, බස්නාහිර පළාත.
3. ලේකම්, සෞඛ්‍ය දේශීය වෛද්‍ය, සමාජ සුබසාධන අමාත්‍යාංශය, බස්නාහිර පළාත.
4. දිස්ත්‍රික් ලේකම්, කොළඹ/කළුතර/ගම්පහ.
5. අධ්‍යක්ෂ, සමාජ සේවා දෙපාර්තමේන්තුව.
6. තැපැල්පති, තැපැල් දෙපාර්තමේන්තුව.
7. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ, පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව, බස්නාහිර පළාත
8. සහකාර අධ්‍යක්ෂ
9. ගණකාධිකාරී
10. මුලස්ථාන සමාජ සේවා නිලධාරී